කුසල් සිත් වැඩි දියුණු කරමු

- **කෙටි පිළිතුරු ලියන්න.**

1. බුදු දහමෙහි ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.
2. සමථ භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
3. සමථ භාවනාව වඩන පුද්ගලයෙකුට තෝරා ගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන කීය ද?
4. භාවනා වැඩිය හැකි සතර ඉරියව් නම් කරන්න.
5. බුදු ගුණ භාවනාව හඳින්විය හැකි වෙනත් නමක් ලියන්න.

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. නීවරණ ධර්ම වල ස්වභාවය කෙබඳු ද?
2. නීවරණ ධර්ම පහ නම් කරන්න.
3. පුද්ගල චරිත වර්ග හය නම් කරන්න.
4. භාවනාවට පිවිසෙන තැනැත්තා ඉටුකර ගත යුතු පූර්ව අවශ්‍යතා මොනවා ද?
5. බුදු දහමෙහි ඉගැන්වෙන භාවනාවෙහි පරමාර්ථය කුමක් ද?
6. බුදු දහමෙහි භාවනාව හඳුන්වා දී ඇත්තේ කෙසේ ද?
7. බුදු දහමෙහි සමථ භාවනාව හඳුන්වා දී ඇත්තේ කෙසේ ද?
8. සමථ භාවනාව වැඩීම තුළින් ලැබිය හැකි උසස්ම ප්‍රතිඵල මොනවා ද?
9. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වීමට පෙර පටන් භාරතීය යෝගීන් අතර සමථ භාවනාව භාවිත වූ බවට නිදසුන් තුනක් සපයන්න.
10. දෛනික ජීවිතයට සමථ භාවනාව වැඩීමෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.